# රූපවාහිනී මාධ්‍යය මගින් ආබාධිත රණවිරු ප්‍රජාව කෙරෙහි සිදු කරන බලපෑම පිළිබඳ අධ්‍යයනයක්

ඩී. එස්. පී. දිසානායක[1]

**සංක්ෂේපය**

උපතින් ආබාධිතයන් නොවූ බොහොමයක් ලාංකීය සමාජය තුළ පැවති යුද්ධය හේතුවෙන් ආබාධිත තතත්වයට පත්ව ඇත. මෙම අධ්‍යයනයෙන් ආබාධිත රණවිරු ප්‍රජාව රූපවාහිනී මාධ්‍යය භාවිතය තුළ ඔවුන්ගේ මනෝභාව ගොඩනගා ගන්නේ කෙසේද යන්න විමර්ශනය කෙරිණි. රාගම රණවිරු සෙවනේ සාමාජිකයන් 100 ක් ඇසුරින් ලබාගත් නියැදියක් මගින් මෙම අධ්‍යයනය කරන ලදි. රූපවාහිනී මාධ්‍ය මගින් ආබාධිත රණවිරු ප්‍රජාව කෙරෙහි සිදු කරන බලපෑම අධ්‍යයනය කිරීම මෙහි මූලික අරමුණ විය. සමීක්ෂණ ක්‍රමය යටතේ, ප්‍රශ්නාවලි ක්‍රමය හා සම්මුඛ සාකච්ඡා ක්‍රමය මගින් ප්‍රාථමික දත්ත රැස් කර ගනිමින් මෙම අධ්‍යයනය සිදු කරන ලදී. නියැදිය අධ්‍යයනය කිරීමෙන් ලබාගත් තොරතුරු බොහෝමයක් ගුණාත්මක දත්ත වන බැවින් ඒ සඳහා SPSS ක්‍රමය භාවිත කරමින් දත්ත විශ්ලේෂණය කරන ලදී. දත්ත විශ්ලේෂණය අනුව 30% ගේ මානසිකත්වය ගොඩැගීම උදෙසා ධර්මදේශනා හා සංගීතමය වැඩසටහන් මූලික වන බවත් ටෙලිනාට්‍යය හා රූපලාවන්‍යය වැඩසටහන් ,වෙළඳ දැන්වීම් 70% මානසික ව්‍යාකූලතා ඇතිකරන බවත් දක්නට ලැබිණි. බෞද්ධයන් වෙනුවෙන් රූපවාහිනී සේවාවක පවත්වාගෙන යන ලාංකීය රූපවාහිනී ක්ෂේත්‍රය ආබාධිතයන් වෙනුවෙන් ද වෙන්වූ රූපවාහිනී සේවාවක් පවත්වාගෙන යාම සහ ආබාධිතයන් වෙනුවෙන්ම වෙන් වූ වැඩසටහන් නිෂ්පාදනය හා ඒ ඔස්සේ ස්වයං රැකියා අවස්ථා උදාකරගැනීමට කටයුතු කිරීම තුළින් සෘණ ආකල්ප සහිත ආබාධිත මානසිකත්වය තුලිත කර ගැනීමට මාර්ග විවෘත කරදිය යුතු බව යෝජනා ලෙස ඉදිරිපත් කළ හැක.

**මුඛ්‍ය පද :** ආබාධිත, රූපවාහිනී මාධ්‍ය, මනෝභාව, ව්‍යාකූලතා

[1] ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය,
sanikapriyanjali@gmail.com